# දූපතක අතරමං වූ ළමයි




ඉනුරි උමායා හපුආරච්චි

# දූපතක අතරමං වූ ළමයි

ඉනුරි උමායා හපුආරච්චි

පළමු දිගහැරුම

මහාමායා බාලිකා විද්‍යාලය
7 ශ්‍රේණිය B

2025 01 30

ISBN 978624208363-6

# පිදුම

කුඩා කළ සිට ලේ කිරි කර පොවා

මා ඇති දැඩි කළ අම්මාට සහ

මා හට ජීවය දුන් අප්පච්චීට

# පෙරවදන

සාහිත්‍යයේ දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි .දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත් වීම සුවිශේෂ සිදු වීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි නාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩ නගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන " හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි . ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය .

විදුහල්පතිනිය
ශෂිකලා සේනාධීර
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# <u>පටුන</u>

1. කොහේද යන්නේ ?

2. චාරිකාව යාමට නීති .

3. ඉසබෙල්ගේ අරුම පුදුම සිහිනය

4. චාරිකාව යාම

# 1. කොහේද යන්නේ ?

එකමත් එක කාලෙක ලන්ඩන් වල බැලේ ක්ලාස් එකක් තිබුණා . සුපුරුදු පරිදි ඉරිදා උදේ ටීචර් ක්ලාස් එකට ආවා. වෙනදාට වැඩිය සිනාවකින් ටීචර් පුටුවේ ඉඳගත්තා .ළමයින්ටත් සිතාගන්න බෑ "ඔයාලා ගොඩක් ආසා කරන දෙයක් තමා මං කියන්න යන්නේ" . ටීචර් කීවා . ළමයෙක් අත ඉස්සුවා . ඇයගේ නම රනෝලියා . ඇය තමා මෙහි සිටින වැඩිමහල්ම කෙනා . ටීචර් ඇයට අවස්ථාව දුන්නා . "ටීචර් මං හිතන්නේ අද අපි අලුත් දෙයක් ඉගෙන ගන්න යන්නේ" . රනෝලියා කිව්වා. " නෑ ඒක නෙවෙයි" ටීචර් කිව්වා . තවත් ළමයින් කිහිප දෙනෙක් අත ඉස්සුවා . මුලින් ම කැත්රිනා නැගී සිටියා . "ටීචර් මං දන්නවා" . "ඔව් ඉතින් කියන්නකෝ" ටීචර් කිව්වා. "ටීචර් ට වැඩක් වැටිලා යන්න වෙලා" කැත්රිනා කිව්වා. ළමයි සියල්ල ම එක්වර ම සිනාසුණා . මේ පන්තියේ ඉන්න විහිළුකාරී තමා ඇය. එවිට ම ටීචර්ට කෝල් එකක් ආවා. "ඔයාලා තව ටිකක් හිතලා බලන්න" කියලා ටීචර් පැත්තකට ගියා. එවිට මදක් ඈත්වී ඉඳගෙන සිටි ළමයි ටික ඉසබෙල් ළඟට එක් රොක් වුණා . ඒත් ඉසබෙල්ට නෙවෙයි දැනුණේ . ඉසබෙල් සෑම විටම සිටියේ රනෝලියා එක්කයි . එවිට ම රනෝලියා ඉසබෙල්ට කතා කළා . "ඉසබෙල් ඔයා බර කල්පනාවක වගේ ඔච්චර මොනවද අනේ කල්පනා කරන්නේ" ? "හරි මං ඔයාලට කියන්නම්" ඉසබෙල් කීවා . ඉසබෙල් කියන්නෙ ටිකක් සූක්ෂමව හිතන ළමයෙක්. "ඔයාලට මතකද ගිය අවුරුද්දෙ ඔක්තෝබර් 29" ඉසබෙල් කිව්වා . "ඔව්

ඔව් මට මතකයි" පේනී කිව්වා .අනේ "ඔව් මටත් මතකයි අපි ට්‍රිප් එක ගියපු දවස" ඇනා කිව්වා. "අන්න හරි ඉතින් බලන්නකෝ අද ඔක්තෝබර් 14" ඉසබෙල් කීවා . "ඒ කියන්නේ අපි තව සති දෙකකින් අපේ වාර්ෂික චාරිකාව යනවා" . රනෝලියා කිව්වා . "හරියට හරි අක්කෙ" ඉසබෙල් කිව්වා . හැමෝම ශබ්ද නොකර ඇහුම් කන් දුන්නේ ටීචර්ට . "ඔව් ඔව් 28 තමයි බස් එක ලෑස්තිනේ" ටීචර් කිව්වා කෝල් එකට . මුහුණෙන් මුහුණ බලාගත්තු ළමයි එක්වරම කෑ ගැහුවා . ටීචර් මේ පැත්තට එනවා . ඇනා කිව්වා . ඇය කෑ කෝ ගහන ළමයෙක්. "ටීචර් මම දන්නවා" කියලා පිනී අත ඉස්සුවා. "ඒයි පේනී ඒක ඉසබෙල්ට කියන්න දෙන්න" . රනෝලියා සැරෙන් කිව්වා ."හරි හරි එහෙනම් කියන්නකෝ" ටක් ගාලා පේනී කිව්වා . "ටීචර් නිගමනය කර විදිහට අපි අපේ වාර්ෂික චාරිකාව යනවා" . ඉසබෙල් කිව්වා ."ඔව් ඔයා හරි" ඒත් ටීචර්ට කියන්න නොදී "හරි " කියන වචනේ ඇහුණ ගමන් හැමෝම කෑ ගහන්න පටන් ගත්තා . "දැන්වත් ඉවරද" ? ටීචර් මේසෙට තට්ටු කරමින් ඇහුවා . හැමෝම නිශ්ශබ්ද වුණා . "මට අහන්න ඕන වුණේ ඉසබෙල් කොහොමද ඒක දැනගත්තේ" කියලා ටීචර් ඇහුවා. ඊට පස්සේ ඉසබෙල් නැගිටලා කියන්න පටන් ගත්තා "ටීචර් මම මුලින් මෙයාලට කිව්වා ඔයාලට මතකද ගිය අවුරුද්දෙ ඔක්තෝබර් 29 කියලා . එතකොට පිනීයි ඇනායි කිව්වා ඔව් අපිට මතකයි අපි චාරිකාව ගියපු දවසනේ කියලා .ඊට පස්සෙ මම කිව්වා අද ඔක්තෝබර් 14 නේ කියලා ඊට පස්සෙ රනෝලියා අක්කා ඒක තේරුම් අරගෙන කිව්වා ඒ කියන්නේ අපි තව සති

2 කින් අපේ වාර්ෂික චාරිකාව යනවා කියලා .ඊට පස්සේ අපිට ඇහුණා ටීචර්ගේ කෝල් එක .ඊට පස්සෙ තමයි මම නිගමනය කළේ" ඉසබෙල් කතාව අවසන් කළා ."ෂා" හැමෝම කියලා අත්පුඩි ගැහුවා . ඊට පස්සෙ ටීචර් කිව්වා "ඒත් පොඩි වැරැද්දක් තියෙනවා කියලා" . "මොකක්ද ටීචර් ඒ" . කැත්රිනා ඇහුවා "ඒක තමයි අපි "......ටීචර් කියමින් සිටියදී ඇනා මැදින් පැන "ඈ ..අපි ට්‍රිප් එක යන්නෙ නැද්ද" ? ඇය දුකින් ඇසුවා . "නෑ නෑ මං මේ කියන්න යන්නෙ වෙන දෙයක් අපි අපේ වාර්ෂික චාරිකාව යනවා" . "ඒත් ගුරුවරුන්ගේ කෝල් අහගෙන ඉන්න එක නම් වැරදියි හරිද" ? ටීචර් කිව්වා . හැමෝම සතුටින් ඉද්දි ටීචර් අන්තිමට කිව්ව එක ඇහුණේ ඉසබෙල් ට විතරයි . එයා නැගිටලා "සොරි ටීචර්" කිව්වා . "සොරි ටීචර්" හැමෝම කිව්වා . "එහෙනම් ටීචර් අපිට දැන් කියන්නකෝ විස්තර ට්‍රිප් එක ගැන" .පිනී කිව්වා . " එහෙනම් මම කියන්නම්කෝ අපි මුලින්ම බස් එකක් බලන්න ඕනෙ නේ මම බස් එකක් බැලුවා .ඒකෙම්ම තමයි දැන් කෝල් එකක් ආවේ" ටීචර් කිව්වා . "අපි අහගෙන හිටියේ ටීචර්" රෝස් කිව්වා . ඇය පිනීගෙ නංගීය . "අනේ අනේ පොඩිකමටද කතා" ටීචර් කියලා ආයෙමත් ට්‍රිප් එක ගැන කියන්න පටන් ගත්තා ." මම තැන් දෙකක් බලලා තියෙන්නේ එකක් බර්ඩ් පාක් අනිත් එක ඒක දූපතක් . මොකේටද ඔයාලා කැමති" .

"අපි කැමතියි ඉසබෙල් කැමති දෙයකට" ළමයින් ටික වෙලාවකින් පසු කිව්වා . "එහෙනම් ඉසබෙල් කියන්නකෝ යාළුවන්ගේ ආසාවනේ . මං හිතන්නේ ඔයා කැමති වෙන්නේ දූපතකට යන්න" ටීචර් කිව්වා ..."ඔව් ටීචර් අපි දූපතකට යං"

ඉසබෙල් කිව්වා .ඊට පස්සෙ ටීචර් කිව්වා "අපි යන්නෙ ස්වීසන් දූපතට" ."ටීචර් මං ඒ නම අහලා තියෙනවා .ඒකෙ බලගතු දෙයක් තියෙනවා" .ඉසබෙල් කිව්වා ."අපි කතා කර කර ඉඳලම වෙලාව ගිහිල්ලා අද අපි මොකුත් කරෙත් නැහැ. එහෙනම් බායි" හැමෝටම ටීචර් කිව්වා .

## 2 . චාරිකාව යාමට නීති

ඊළඟ දවසේ ටීචර් පන්තියට ආවේ ලොකු කොලයක් අතේ තියාගෙනයි ."ගුඩ් මෝර්නින් ළමයි" ටීචර් කිව්වා . "ගුඩ් මෝර්නින් ටීචර්" ළමයි කිව්වා . "ටීචර් ටීචර්" ළමයෙක් කිව්වා "ඇයි ඇයි මැරෙන්න යන්නේ" ටීචර් කිව්වා . "මොකක්ද ටීචර් ඔය කොළේ " පිනී ඇහුවා ."ඒකට කලින් කියන්න අපි තැනක කොහොමද ඉන්න ඕනෙ කියලා" . ටීචර් කිව්වා . "කෑ ගහන්නේ නැතිව ඉන්න ඕනෙ". රනෝලියා කිව්වා . "දඟලන්නේ නැතිව ඉන්න ඕනෙ". පිනී කිව්වා. "හරි එක්කෙනා කිව්වෙ" ටීචර් කිව්වා ."කන තැන පිළිවෙළට තියෙන්න ඕනෙ" ඇනා කිව්වා . " කවුද දන්නේ ඒවාට කියන එක වචනයක්" ටීචර් කිව්වා. ටිකක් වෙලාවක් නිහඬතාවක් පැවතුණා . ඉසබෙල් යාන්තම් අත ඉස්සුවා . "ආහ් ඔව් කියන්න ඉසබෙල්" ටීචර් කිව්වා. ඉසබෙල් නැගිට්ටා . "ටීචර් මං හිතන විදිහට සංවරකම" ඉසබෙල් කිව්වා . "හරියට හරි ඉසබෙල් හරි මං දැන් එයාලට පෙන්වන්නම් මේ කොළේ මේකෙ තියෙන්නේ වෙනස්ම නීති ටිකක්" ටීචර් කිව්වා.

ටීචර් ඉස්සරහ තිබ්බ බිත්තියේ කොළේ ඇලෙව්වා .ඊට පස්සෙ ටික වේලාවක් නිහඬතාවයක් පැවතුණා .

## සංවරකම

බස් රථයේදී

හිස එළියට දැමීම තහනම්

බස් රථයෙන් එළියට අනවශ්‍ය දේ විසි කිරීම තහනම්

වෙළඳසල් තුළදී

පේළියට ගමන් කළ  යුතුයි

පොරකන්න තහනම්

බස් එකෙන් බැස යන විට

පේළියට යා යුතුයි

කෑ කෝ ගැසීම තහනම්

ලොකු අක්කා කියන දේ හැමෝම අහන්න ඕනෙ.

"හරි ද හැමෝම කියෙව්වද" ? නිහඬතාවය බිඳිමින් ටීචර් ඇහුවා . නෑ ටීචර් පුංචි කටහඬක් ඇහුණා . "ආහ් මේ රෝස් නෙ ... කාටද පුළුවන් හැමෝටම ඇහෙන්න කියවන්න" ටීචර් ඇහුවා . "ජෙනීට දෙන්න" හැමෝම කිව්වා . "ආහ් අපේ කටකාරි ඉන්නවනේ"ටීචර් කිව්වා . ජෙනී නැගිටලා හැමෝටම ඇහෙන්න කියෙව්වා . "හරි දැන් ඔයාලට ඇහෙන්න ඇති නේද ? මේකෙ

තියෙන දේවල්" ටීචර් කිව්වා ."ඔව් ටීචර් අපිට තේරුණා" හැමෝම කිව්වා . "හරි හැමෝම මට ලියුම ගෙනත් දෙන්න ඕනෙ ට්‍රිප් එක යන්න කැමති කියලා .ඔයාලා ඒක බ්‍රහස්පතින්දාට කලින් මෙතන සිකුරිටි අංකල්ට දීලා යන්න බ්‍රහස්පතින්දාට පස්සෙ ගෙනත් දුන්නොත් එයාට ට්‍රිප් එක යන්න බැරිවෙයි" ටීචර් කිව්වා . "එතකොට ටිචර් අපි ඇඳන් එන්නේ මොනවද" ? කැත්රිනා ඇහුවා . "ආ ඊළගට මං කියන්න යන්නේ ඒ ගැන .පොඩ්ඩක් රනෝලියා ඉස්සරහට එන්නකෝ" ටිචර් කිව්වා . රනෝලියා ඉස්සරහට ආවා . රනෝලියාට ටීචර් ලොකු ඇඳුම් බෑග් එකක් දුන්නා . රනෝලියා ඒ ඇඳුම් ටික හැමෝටම බෙදුවා ."හරි රනෝලියා දැන් ඔයාටත් එකක් අරන් ගිහින් ඉඳගන්න . හරි මං දැන් කියන්න යන්නේ ඔයාලගේ ඇඳුම ගැනයි .ඔයාලා එන්න ඕනෙ ඔය ටී ෂර්ට් එකයි බෙල් බොටම් එකයි ඇඳගෙන තමයි" "එතකොට ටීචර් කොණ්ඩේ" ජෙනී ඇහුවා ."අයියෝ ජෙනීට ලොකු ප්‍රශ්ණයක් තියෙනවානේ ඔයාගේ කොණ්ඩේ ගැන" .ජෙනීට ලැජ්ජා හිතුණා . "හරි හරි මං විහිළුවක් කළේ. ජෙනී මතක් කරපු එක හරි තෑන්ක් යූ ජෙනී කියලා" ටීචර් කියද්දි ජෙනීට ආඩම්බර හිතුණා . "හරි එහෙනම් මං අනිත් දේවල් ගෲප් එකට දාන්නම්" ටීචර් කියලා ඉවරවෙන කොටම ඇනා කතා කරන්න පටන් ගත්තා . "ඒත් ටීචර් තාම 9 යිනේ වෙලාව" කියලා කිව්වා ."හරි හරි මං ඉවරයි කිව්වේ නෑනෙ තාම අද තමයි මම ඔයාලට තව දෙයක් කියන්න ආවෙ ඔයාලට මතකද The Thousand Years වලට නටපු එක අන්න ඒක ප්‍රැක්ටිස් වෙන්න ඕනෙ මොකද අපි ඒ දූපතට යන්න කලින් තියෙන හොටෙල් එකේ

අපිට පාර්ටි එකක් තියෙනවා" "යේ" ජෙනී කිව්වා . "හරි හරි දැන් ප්‍රැක්ටිස් කරන්න යමු" රනෝලියා කිව්වා . ඊට පස්සෙ ක්ලාස් එක ඉවර වුණා . හැමෝම බායි කියලා ගෙවල් වලට ගියා . ඉසබෙල් රනෝලියා එක්ක ගෙදර ගියා .

## 3. ඉසබෙල්ගේ අරුම පුදුම සිහිනය

ඉසබෙල් ඇගේ පරිගණකය භාවිතා කර ස්වීසන් දූපත ගැන හෙව්වා . තොරතුරු හොයන විට එම දූපතේ නිධානයක් සඟවා තියෙනවා කියන වීඩියෝ එක එයා දැක්කා . එම වීඩියෝව බලලා අවසන් වූ විට ම රනෝලියාට කෝල් එකක් ගත්තා .ඇය රනෝලියාට කතා කරන්න පටන් ගත්තා . "හලෝ රනෝලියා අද මම ස්වීසන් දූපත ගැන හොය හොයා ඉද්දි මම වීඩියෝ එකක් දැක්කනේ ඒකෙ කියන විදිහට නම් ලංකාවෙ රජ කෙනෙකුගේ නිධානයක් ඒකෙ වලලා තියෙනවා . මං හිතන විදිහට ඒ රජතුමාගේ ආභරණ වෙන්න ඕනෙ" ඉසබෙල් කිව්වා ." ඇයි ඒ නිධානෙ මේ ස්වීසන් වල තියෙන්නේ" රනෝලියා ඇහුවා . "අනේ මන්දා දැන් රෑත් වෙලා මට මහන්සි මං යනවා නිදා ගන්න" ඉසබෙල් එහෙම කියලා කෝල් එක කට් කරලා නිදාගත්තා . ඇය හීනයක් දැක්කා . එයාලා දූපතේ යන විට එයාලට පුරාණ කාලේ ලාංඡනයක් හම්බ වුණා . ඊට පස්සේ එයාලා ඒක අතට ගන්න විටම එතන තිබ්බ දොරක් ඇරුණා . ඊට පස්සෙ ඉසබෙල් නින්දෙන් ඇහැරුණා .ඉසබෙල් වෙලාව බැලුවා .අයියෝ තවම පාන්දර 2 යි ඉසබෙල් එයාටම කියා

ගත්තා . ඉසබෙල් හීනේ ගැන හිතන්න පටන් ගත්තා . ඇයි මං ඒ වගේ හීනයක් දැක්කේ හවී හරි හෙට මං මේ ගැන ගිහිං රනෝලියා අක්කට කියන්න ඕනෙ එහෙම කියලා ඉසබෙල් නිදා ගත්තා . ඊට පස්සෙ ඉස්කෝලෙ ගිහින් දැකපු හීනෙ ගැන රනෝලියාට කිව්වා . ඔයා ඊයෙ බලපු වීඩියෝ එක නිසා වෙන්න ඇති ඒ වගේ හීනයක් දැක්කෙ . හරි බායි මං යනවා ඉරිදට හම්බ වෙම කියලා ඉසබෙල් පන්තියට ගියා .

## 4. චාරිකාව යාම

සෙනසුරාදා රාත්‍රියත් එළඹුණා. ඉසබෙල් ඇඳුම් දාගෙන බෑග් එක ලෑස්ති කර ගත්තා . ඊට පස්සෙ එලාම් තියලා නිදා ගන්න ගියා . උදේ සීනුව නාද වුණා .එතකොට වෙලාව උදේ 3.00 යි . ඊට පස්සෙ ඉසබෙල් ලෑස්තිවී තාත්තා සමග කාර් එකේ ක්ලාස් එක ළඟට ගියා . එතකොට රනෝලියා ඇවිත් හිටියා .බස් එකත් ඇවිල්ලා තිබ්බා .ඉසබෙල්ගෙ තාත්තා ටීචර්ට ඉසබෙල්ව භාරදීලා ගෙදර ගියා .ඊට පස්සෙ ඉසබෙල් ගිහිල්ලා බස් එකට නැග්ගා .එතකොට ජෙනියි ඇනායි රෝසුයි පිටි පස්සෙම ශීට් එකේ ඉන්නවා දැක්කා . "ඉසබෙල් රනෝලියා අපි පිටිපස්සෙ ඉන්නේ එන්න පිටි පස්සට" ජෙනී කෑ ගැහුවා .ටික වෙලාවකින් හැමෝම ඇවිත් බස් එකට නැග්ගා . ඊට පස්සෙ ට්‍රිප් එක යන්න පටන් ගත්තා . ඊළඟට කෑම කන්න පාර්ක් එක ළඟ නැවැත්තුවා . ජෙනී සෙල්ලම් කර කර ඉන්නකොට ඉසබෙල්ගේ කකුලේ පැටලිලා

වැටුණා . ඊට පස්සේ රනෝලියා ළඟ තිබ්බ බෙහෙත් වලින් බෙහෙත් දැම්මා . ඊට පස්සෙ හැමෝටම ඇවිත් බස් එකට නගින්න කිව්වා . ඊට පස්සෙ බලද්දි ජෙනී ගෙනාපු බෝලේ පාර්ක් එකේ දාලා ඇවිල්ලා . ආයෙ බස් එක හරවන් ගිහිල්ලා බෝලෙ අරන් ආවා . බස් එක හරවනකන්ම ජෙනීගෙ ඇස්වල කඳුළු තිබ්බා . ඊට පස්සෙ ආයෙත් සින්දු කියන්න පටන් ගත්තා . 9 විතර වෙද්දි එයාලා අර හොටෙල් එකට ගියා. ඊට පස්සේ හැමෝම බැලේ ඇඳුම් ඇඳ ගත්තා . ඒත් ජෙනීට නටන්න බෑ කියලා එයා ඉඳගෙන හිටියා . ඊට පස්සෙ අනිත් අය නැටුවා . ජෙනී එයාලා නටලා ඉවර වෙනකල් හිටියෙ දූපතට යන්න . ඊට පස්සෙ දවල්ට කෑම කාලා හවස 3 ට විතර දූපතට යන්න බෝට්ටුවට නැග්ගා . ඊට පස්සෙ හැමෝම දූපතට ගියා ."අම්මෝ මේක ටිකක් අද්භූතයි නේද ? මට නම් බයකුත් දැනෙනවා අපි බහිමු ඇනා" කියලා බැස්සා . හරි දැන් ඔයාලා වයස පිළිවෙලට පෝලිම හදාගන්න ටීචර් ඉස්සරහට ගියා . "කෝ ඉසබෙල් කෝ ඇනා" කිය කිය ජෙනී පෝලිම හදනවා . ජෙනී තටින්ද හැදෙන්නේ . රනෝලියයි ඉසබෙලුයි පිටි පස්සෙන් එන්න ටීචර් කිව්වා . දූපතේ ටිකක් ඇතුලට යද්දි ඉසබෙල් දැක්කා ටිකක් දිලිසෙන දෙයක් .ඉසබෙල් ඒ පැත්තට යන්න යද්දි රනෝලියා දැක්කා . ඊට පස්සෙ ඇහුවා "ඉසබෙල් කොහෙද යන්නේ" කියලා . "අර ඔයාට පේන්නෙ නැද්ද අතන දිලිසෙන දෙයක් තියෙනවා" ඉසබෙල් කිව්වා . "ඔව් ඔව් මට පේනවා දැන් ඔයා එතනට යන්නද යන්නේ රනෝලියා ඇහුවා .ඔව් ඔව් ඔයාට බෑ නම් එන්න එපා . මං තනියෙන් යන්නම්" ඉසබෙල් තරහෙන් කියමින් ඒ

පැත්තට ගියා . ඊට පස්සෙ රනෝලියත් ගියා . රනෝලියයි ඉසබෙලුයි යනවා දැකලා කැත්රිනාත් පස්සෙන ගියා . ඊට පස්සෙ ඒ කට්ටිය යනවා දැකලා ජෙනී ජෙනීගෙ නංගි එනම් රෝසුයි ඇනාත් පස්සෙන ගියා . ඊට පස්සෙ හැමෝම අර දිලිසෙන දෙය ළඟට එක් රොක් වුණා . "ඉසබෙල් අපිට ආයෙ ගෙදර යන්න බැරි වෙයිද" ? ඇනා ඇහුවා . ඔයාට ඉන්න බැරි නම් මොකටද ආවෙ ඉසබෙල් තරහෙන් ඇහුවා . ඉසබෙල් ඒක අතට ගත්තා . "මේක යතුරක් ඔයාලා බලන්න මේ හරියේ දොරක් තියෙනවාද කියලා" ඉසබෙල් කිව්වා . "ඉසබෙල් ඔයා ඔය යතුර දිහා බලන්නකෝ ඒක හරිම අමුතුයිනෙ" රනෝලියා කිව්වා .
"පොඩ්ඩක් ඉන්න මං කිව්වා නේද අර මං බලපු වීඩියෝ එකක් ගැන . අන්න ඒකෙත් මේ ලාංඡන ටිකම තිබ්බා .ඒ ලාංඡනවලින් කියවෙන්නේ මේක නාගයෙක් ආරක්ෂා කරන එක ".

ආරක්ෂා කිරීම

නාගයා

මේ වස්තුව

මේ වස්තුව නාගයකු ආරක්ෂා කිරීම

මේ තියෙන්නේ ලතින් කියන භාෂාව. ගූගල් එකේ ගැහුවාම එනවා . ඉසබෙල් කියාගෙන කියාගෙන ගියා . ඊට පස්සෙ කොහොම හරි ඉසබෙල් ටීචර්ව හොයාගෙන ගියා . එතකොට බලද්දි බෝට්ටු ටිකත් නෑ.
ඉතිරි කොටස 2 වන කොටසින් පොතෙන් වන්න.........

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොට ගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීමට සහ එළි දැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි . එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි . පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි .

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි . මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ගුරු භවතුන් දියණියන් දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි . පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය . මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමග දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතුවී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි . මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි . තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩ නගා දී තිබේ. තම නිසග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක<br>
සෙනෙවිරත්න මහලේකම්